# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Westpac |
| BSB Number | - 033 341 |
| Account Number | - 590847 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡායා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වගයි

# නව යුගයක ඇරඹුම

අද ජනවාරි 9. ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී වූ ජනාධිපතිවරණයකින් පසු මෛත්‍රීපාල සිරිසේන මහතා ජය ගැනීම ඔහු ලද ජයක් ලෙස නොව පොදු ජනතාවගේ ජයක් ලෙස දකින්නට අපි කැමැත්තෙමු.

සන්නස ජනපතිවරණය ආරම්භයේ සිටම මෛත්‍රීපාල සිරිසේන මහතා වෙනුවෙන් පෙනී සිටි බව රහසක් නොවේ. අපි මේ ආකාරයෙන්ම මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන්ද පෙනී සිටියෙමු. අතීතයේදී මහින්ද රාජපක්ෂ මහතාට සහය දුන් අපේ දැක්ම ඔහු ඉවත් කිරීමක් දක්වා පරිවර්තනයකට ලක්වූයේ මන්දැයි පැහැදිළි කර දීම අපේ යුතුකමක් ලෙස අපි සිතමු.

පළමුව, මහින්ද සමාජයේ පාදඩ පිරිස් තමන් වෙත ළං කර ගැනීමත් ඔවුන් නැළවීමත් සැනසීමත් උන්ට වරප්‍රසාද දීමත් අපි අනුමත නොකළෙමු. මිනීමරුවන්, කුඩු ගෙන්වා බෙදාහරින්නන්, ස්ත්‍රී දූෂකයන්, හොරුන් , පාදඩයන්, කිසිම හිරිකිතයකින් තොරව ළං කර ගත්තා පමණක් නොවේ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම වැළැක්වීමද මහින්ද අතින් සිදුවිය. ඔවුන් මන්ත්‍රී කම් වලින් පමණක් නොව ඇමති කම් වලින්ද පුද සත්කාර ලැබුවේය. කිසිදු නායකයකු කිසිදු අවස්ථාවක කිසිදු හේතුවක් නිසා පාදඩයන් ළං කර නොගත යුතුය යන්න අපි තරයේ විශ්වාස කරමු.




මහින්ද නීතිය ගණිකා වෘත්තියේ යෙදවීම අපේ පිලිකුලට හේතු විය. තමන්ට අවශ්‍ය ආකාරයේ නඩු තීන්දු ලබා ගැනීම සඳහා තමන්ට හිතවත් විනිශ්චයකාරවරුන් පත්කිරීමත් තමන් අකැමැති විනිශ්චයකාරවරුන් ඉවත් කිරීමත් නායකයකු නොකළ යුතු දේය. අගවිනිසුරු ශිරාණි බණ්ඩාරණායක මහත්මිය ඉවත්කිරීම එහි කූටප්‍රාප්තිය විය. අටේ පන්තිය සමත් විමල් වීරවංශ වැනි දූෂිතයන් ලවා නඩු අස්සවා අගවිනිසුරුවරිය බලහත්කාරයෙන් ඉවත්කිරීමත් තමන්ගේ ගජ මිතුරු මොහාන් පීරිස් ඒ තනතුරට පත්කිරීමත් රාජපක්ෂ පාලනය අධිකරණයට කළ විශාලම අතපෙවීම විය. අධිකරණය කොයි තරම් දුරට පිරිහුණාද කිවහොත් අගවිනිසුරු මොහාන් පීරිස් මහතා රාජපක්ෂගේ නිවසේ උත්සව වලත් සංචාර වලත් ඔහු අසළින්ම සිටිනු දක්නට ලැබුණි. අධිකරණයේ අධිපතියා දේශපාලකයකුගේ සමීපතම මිතුරකු වූ විට සාධාරණ විනිශ්චයක් කොතැනින් බලාපොරොත්තු වන්නද? අධිකරණය කෙතරම් දේශපාලනයට නතු වී තිබුනාද යන්නට සමීපම උදාහරණය පෙන්වා දුන්නේ ජනාධිපතිවරණය පැවැත්වෙන අතර තුරදීම ය. ඒ දනුන තිලකරත්නට ඇප ලබා දීමයි. ඒ ඇප ලබා දීම කෙරුණේ ගෝඨාභය රාජපක්ෂ ගේ පොරොන්දුව අනුව බව කියා සිටියේ ආණ්ඩුවට කරණමක් ගැසූ ජයන්ත කැටගොඩයි. පසුගිය කාලය පුරාවටම අධිකරණයේ තිබූ සැබෑ තත්වය එය විය. නඩු තීන්දු ලියැවුණේ උසාවි වල නොවේ. දේශපාලකයන්ගේ නිවෙස් වලය. තමන්ට අවශ්‍ය මිනීමරුවන් නිදහස් කෙරුණ අතර තමන්ගේ විරුද්ධවාදීන්ට නඩු පිට නඩු පටලන්නට මේ අධිකරණයම යොදා ගැනුණි. මේ අවනඩුවට එකඟ විය හැක්කේ මන්ද බුද්ධිකයනට පමණකි.

පොලිසිය හමුදාව දේශපාලනයට යට කිරීම අපට අනුමත කළ නොහැකි දෙයක් විය. ස්වාධීනව පැවතිය යුතු ආයතනයක් වන පොලිසිය දේශපාලකයන්ගේ අමන නියෝග පිළිපදින නිවට ආයතන බවට පත් කර එම ගෞරවණීය සේවය කුණු බක්කියට දමා තිබුණි. පොලිසියේ උසස් නිලධාරීන් මිනීමරුවන්ට සැලියුට් ගසනු අපි අනන්තවත් දැක්කෙමු. සුධර්මන් රදලියගොඩ වැනි වරෙන්තුකාරයන් පොලිස් නිලධාරීන් සමග කදේ දමාගෙන සිටිනු අපි බලා සිටියෙමු. දේශපාකයන්ගේ අවශ්‍යතාව මත මිනීමරන්නටත් පැහැරගන්නටත් අතුරුදන් කරන්නටත් රහසිගත කල්ලි පොලිසියටත් හමුදාවටත් අනුබද්ධව පිහිටුවා තිබුණි. කෙළින් කතා කරන මිනිසුන් දිවි රැක ගැනීම සඳහා රටින් පැන යන තත්වයට පත්විය. නීතියට පිටින් වැරදිකරුවනට දඬුවම් කරන තරම් අශිෂ්ට තත්වයකට රට පත්විය. මෝරුන් සැප සේ දිවි ගෙවද්දී හාල්මැස්සන් අල්ලා දඬුවම් දෙනු බලා සිටියෙමු. කුඩු තොග පිටින් ගෙන්වන්නාට සැලියුට් ලැබෙද්දී කුඩු පැකට් එකක් දෙකක් සමග අල්ලා ගත් පුද්ගලයනට දඬුවම් ලැබුණි. කඩු කන්ටේනර නිදහස් කර ගැනීමට ඉහළ දේශපාලකයන්ගේ ලිපි ලැබෙද්දී පොලිසියට නුදුටුවා සේ ඉවත බලා සිටින්නට සිදුවිය. මේ සිදුවීම අතර ජුගුප්සාජනකම සිදුවීම මීගමුවේ කඩු අල්ලාගත් විට ජනාධිපතිවරයාම ගොස් සැකකරුවා වැළඳ ගැනීමයි.

පොදු මහජනයාගේ දරුවන් අන්ත දුක් විඳිද්දී ජනාධිපතිවරයා සිය දරුවන්ට ලබා දුන් අධික සුඛවිහරණය අතිශය අප්‍රසන්න විය. එක් දරුවක තමන් සහභාගි වූ තරගයක තීරකයා තමන්ගේ කණ්ඩායමට එරෙහිව තීරණයක් දුන් විට තීරකයාට පහර දුන්නේය. ජනාධිපති තාත්තා කළේ තීරකයා බිය ගන්වා කිසිවකු තමන්ට පහර නොදුන් බව කියවා ගැනීමයි. නියම නායකයකු නම් කළ යුතුව තිබුණේ ලෝකයට පේන්නට හෝ තම පුතාට තරවටුවක් කිරීම නොවේද? සිය දරුවන්ට කෝටි ප්‍රකෝටි ගණන් වටිනා යාන වාහන ගෙන්වා දෙන්නටත් ඒ වෙනුවෙන්ම රටේ නීති පවා වෙනස් කරන්නටත් මේ තාත්තා පියවර ගත්තේය. අගනුවර පමණක් නොව ජාතියේ මුදුන් මල්කඩ වන් දළදා සමිඳු වැඩ වසනා මහනුවර පවා පාරවල් වසා කාර් රේස් පදින්නට සිය දරුවන්ට ඉඩ සාදා දුන්නේ මහනායක හිමිවරුන්ගේ ඉල්ලීම් පවා තුට්ටුවකට මායිම් නොකරමිනි. පාසලට දමන්නට සපත්තු දෙකක් නැතිව අහිංසක දරුවන් සිය දිවි නසා ගනිද්දී ජනාදිපති පුතුන් ඇන්දේ ලක්ෂ ගණන් වටිනා සපත්තුය. මැති ඇමති වරු පවා ජනාධිපතිගේ දරුවන්ට "සර්" යයි කියමින් වැඳ වැටිය යුතු තත්වයට පත්කෙරුණි. ලොකු පුතාට සුවිශේෂ කාමරයක අන්තර්ජාල පහසුකම් පවා සහිතව විභාගයකට ලියා නීතිඥ කම ගන්නට ඉඩ සළසා දුන් ජනාධිපති තාත්තා ඒ පිළිබඳව පැමිණිළි කළ නීති සිසුවාගෙන් පන් පන්නා පළි ගත්තේය. ඔහු තම දරුවන්ට ක්‍රීඩා කරන්නට එංගලන්තයෙන් අශ්වයන් ගෙනා පුවත සත්‍ය එකකි. ඒ අශ්වයන් නුවරඑළියේ රඳවා තැබුණ අතර පුතුන් උදයේ තම පෙම්වතියන් සමග හෙලිකොප්ටර වලින් නුවරඑළි ගොස් අශ්වයින් පැද සවස නැවත හෙළිකොප්ටරවලින් කොළඹ ආවේ මහජන මුදලිනි. එක් ජනාධිපති පුතෙකුගේ පෙම්වතියගේ කළින් පෙම්වතා වූ රගර් ක්‍රීඩකයා අභිරහස් ලෙස මිය ගියේ රිය අනතුරකිනි. පැවැත්වූ පරීක්ෂණයක් නැත. එක පුතෙකුගේ රොකට් සිහිනය සැබෑ කරනු වස් මහජන මුදල් කෝටි ගණනක් වැය කර චන්ද්‍රිකාවක් ගුවන් ගත කළ බව කීවත් ඒ චන්ද්‍රිකාව අද ආගිය අතක් නැත. ජනාධිපති දරුවන් රූපවාහිනී නාළිකා ගුවන්විදුලි නාළිකා ගෙඩි පිටින් අයිති කරගත්තේ කොතැන තිබූ මුදලකින්ද? ජනාධිපති පුතුන් සහ ඇමති පුතුන් නීතියට ඉහළින් මහේශාඛ්‍ය ලෙස ජීවත් වෙද්දී දුප්පත් මහජනතාවගේ දරුවන් සිය අයිතිවාසිකම් වෙනුවෙන් මහපාරවල ගුටිකනු අපි කම්පාවෙන් බලා සිටියෙමු. මහින්ද රාජපක්ෂ කිසි ලෙසකින්වත් ආදර්ශමත් පාලකයකු නොවීය.

මහින්ද රාජපක්ෂ පාලනය තුළ වැරදිකරුවන් අතිශය පිළිකුල් සහගත ලෙස ආරක්ෂා කෙරුණි. තමන්ගේ වන්දිභට්ටයන් කරන සියළු වැරදි වලට ජනාධිපතිවරයා සිටියේ නෑසූ කන්වය. මිනීමරුවන් පවා ආරක්ෂා කෙරුණේ ලංකා ඉතිහාසයේ කිසි දිනෙක සිදු නොවුණ අයුරින්ය. කාන්තාවන් 100 ක් දූෂණය කළ සතුටට සාද දැමූ සාරුවා සුනිල් වැන්නවුන්ගේ සාද වලට ඇමතිවරුනා සහභාගිවෙද්දී ජනාධිපති නොදුටුවා සේ සිටියේය. සිය ගජ මිතුරන්ට කෝටි ප්‍රකෝට ගණන් මුදල් හම්බකරගන්නට ඉඩ දී බලා සිටියේය. කලාකරු වේශයෙන් සිටින ජැක්සන්ලා භාතිය සන්තුෂ්ලා හම්බ කරගත් මුදල් කන්දරාව දන්නේ දෙවියන් පමණකි. උපදේශක තනතුරු වලින් පුද ලද ඇත්තන් ඇතුළු මේ නඩය රාජපක්ෂ වෙනුවෙන් හඬා වැටීම දෙස අපි පිළිකුලෙන් බලා සිටියෙමු. මේ හඬන්නේ තමන්ට අහිමිව යන මුදල් හා තාන්න මාන්න වෙනුවෙන් බව අපි සක්සුදක් සේ දැන සිටියෙමු.

බලය රැක ගනු සඳහා රාජපක්ෂ තරම් ජාතිවාදය උපයෝගී කරගත් පාලකයකු ලංකා ඉතිහාසයේ නැත. අවසානයේ ඔහුට වල කැපුවේද ඒ ජාතිවාදයම වීම දෛවයේ සරදමක්ම විය. ව්‍යාජ කොටි භීතියක් නිරන්තරයෙන් ජනතා සිත් තුළට බලයෙන් කාන්දු කරවමින් අවසන් මොහොත දක්වා ඔහු ජාතිවාදය ඇවිස් සූ ආකාරය නැවත නැවතත් ලිවිය යුතු දෙයක් නොවේ.

රාජපක්ෂ පාලනයේ අගතිය පිළිබඳව දිගින් දිගටම ලිවිය හැකි වුවත් මේ සටහන කෙටි කරනු වස් තවත් එක් දෙයක් ගැන පමණක් කතා කරන්නට අපි සිතමු. ඒ ජනමාධ්‍යයයි.

ජනමාධ්‍ය ක්ෂෙත්‍රයේ මහින්ද කළ අත පෙවීම අතිශය බරපතළ විය. මුදලින් තාන්න මාන්න වලින් වෙනත් ලාභ ප්‍රයෝජන වලින් බොහෝ මාධ්‍යකරුවන් නම්මා ගන්නට ඔහුට හැකි විය. එසේ නම්මා ගත නොහැකි වූ මාධ්‍ය කරුවනට තර්ජනය කරන්නට මරා දමන්නට අතුරුදන් කර දමන්නට අඬු කඩන්නට ඔහු පසුබට නොවීය. මාධ්‍ය ආයතන ගිනිබත් කර දැමුණි. බෝම්බ ප්‍රහාරයට ලක්විය. අදීන මාධ්‍යකරුවෝ ජීවිත බේරාගනු වස් රටින් පැන ගියහ. **මහින්දට බලයට එන්නට ආශිර්වාද කළ ඔහුගේ මිතුරකුව සිටි සන්නසට පවා ඔහුගේ තර්ජනයේ හස්තිය දිගු විය. "කිසි ලෙසකින්වත් අප විවේචනය නොකළ යුතුය" ජනමාධ්‍ය කෙරෙහි මහින්ද ගේ දැක්ම එබඳු විය. එක්කෝ අපි තර්ජනයට බිය වී නිවටයන් සේ අපේ පෑන බිම තැබිය යුතු වූයෙමු. නැත්නම් අවදානම පිළිබඳ බිය නොවී අදීනව කටුයතු කළ යුතු වෙමු. අපි දෙවැන්න තෝරා ගත්තෙමු. රාජපක්ෂ නම් වන ඒකාධිපති පාලකයා ගේ පාලනය හමාර කරන්නට අපි අපට හැකි පමණින් දායක වන්නෙමුයි අපි තීරණය කළෙමු.**

මෛත්‍රීපාල සිරිසේනගේ ජයග්‍රහණයෙන් අපි සතුටු වන්නෙමු. ඒ අපේ මව්බිමට යම් තරමකින් හෝ සහනයක් ලැබෙනු ඇති බව අප දන්නා නිසාය. එසේ වුවද අපි කිසිම නායකයකු වන්දනාමාන කරන්නටවත් අදහන්නටවත් සූදානම් නැත්තෙමු. මෛත්‍රීපාල සිරිසේන මහතා ඔහු පොරොන්දු වූ පරිවර්තනය කරනු ඇතැයි අපි අද විශ්වාස කරන්නෙමු. ඔහු සිය යුතුකම ඉටු කරනතාක් අපි ඔහු සමග සිටින්නෙමු. එසේ නොවන දාට අප මහින්ද අතහැරියාක් මෙන් දෙවරක් නොසිතා මෛත්‍රීපාලද අතහරින්නෙමු. අප එසේ කරන්නේ අප පාලකයන්ට නොව රටට ආදරය කරන නිසාවෙනි.

**ඔබ තේරුම් ගත යුතු දෙයක් ඇත. අප ආදරය කරන්නේ පාලකයන්ට නොවේ. මිනිසුන්ටය.**

**සංස්කාරක**